වාර්ෂික වාර්තාව 2017

සංචාරක සංවර්ධන අරමුදල

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

සංචාරක සංවර්ධන අරමුදල
වාර්ෂික වාර්තාව - 2017

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

2018 ජනවාරි මස 02 වන දින
ගරු ජෝන් අමරතුංග මහතා,
සංචාරක සංවර්ධන, වනජීවී හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු අමාත්‍යතුමනි,
යොමුව: සංචාරක සංවර්ධන අරමුදල

2005 අංක 38 දරණ පනතේ 23(1) වගන්තිය යටතේ පිහිටුවා ඇති සංචාරක සංවර්ධන බද්දේ මූල්‍යමය සම්පත් සංචාරක කර්මාන්තයේ අභිවෘද්ධිය සඳහා යොදා ගත යුතු බව ඔබගේ කාරුණික අවධානයට ලක් කිරීමට කැමැත්තෙමි. මෙම අරමුදලට මුදල් සපයා ගැනීම මෙන්ම ඒවා බෙදාහැරීම එකී 2005 අංක 38 දරණ සංචාරක පනත මගින් තීරණය කෙරේ.

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (2) වන වගන්තියට අනුව, සිවිල් ගුවන් සේවා අධිකාරිය සංචාරක පිටවුම් බද්දෙන් ඇ.ඩො. 5 ක මුදල් ප්‍රමාණයක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ලබා දේ. තවද, සංචාරක ක්ෂේත්‍රයේ නිරත සමාගම් විසින් සංචාරක සංවර්ධන බදු ලෙස කාර්තුමය පදනම මත උක්ත අරමුදල වෙත මුදල් ගෙවනු ලැබේ.

2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාලසීමාව තුල සංචාරක සංවර්ධන බද්දේ මුළු මුදල රු.මිලි. 3,932.64 ක් වන අතර, එය 2016 වසරේදී රු.මිලි. 3,664.15 ක් විය.

2017 වසර තුලදී උක්ත අරමුදලට ලැබූ හා එය විසින් ලබා දුන් මුදල් පිළිබඳ විස්තර මෙම වාර්තාවේ අඩංගු වේ.

ස්තුතියි.

අත්. කළේ
කාවන් රත්නායක
සභාපති
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

පටුන

	පිටු අංක
හැඳින්වීම	01
මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය	02
මූල්‍ය කාර්යය සාධනය පිළිබඳ ප්‍රකාශනය	09
හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය	10
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	10
ගිණුම් සඳහා සටහන්	11-13
විගණකාධිපති වාර්තාව	14

හැඳින්වීම

2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (1) වගන්තිය යටතේ ස්ථාපිත ඇති සංචාරක සංවර්ධන අරමුදල සංචාරක කර්මාන්තය වැඩිදියුණු කිරීම 2005 අංක 38 දරණ සංචාරක පනතේ අංක 23(1)වගන්තිය යටතේ ස්ථාපිත කර ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය මගින් මෙම අරමුදල පාලනය කිරිම හා මෙහෙයවීම සිදු කෙරේ. 2005 අංක 38 දරණ සංචාරක පනතේ 23 (2) වගන්තිය අනුව, සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් 2003 අංක 25 දරණ මූල්‍ය පනතේ 2 වගන්තිය ප්‍රකාරව සංචාරක සංවර්ධන අරමුදලට ගෙවන අපගමන බද්දෙන් ඇ.ඩො. 5ක මුදලක් ලබා දේ.

තවද, අරමුදලට ලැබෙන මුදල් 2003 අංක 23 දරණ මුදල් පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සියළුම ලියාපදිංචි සංචාරක ආයතන වලින් සංචාරක සංවර්ධන බද්දක් පනවා, රැස් කිරිම සිදු කරයි.

2005 අංක 38 දරණ සංචාරක පනතේ 24(8)වගන්තිය අනුව, අරමුදලට බැරවෙන මුදල් සියල්ලම පහත පරිදි බෙදා හරිනු ඇත.

a. 2005 අංක 38 දරණ සංචාරක පනතේ වගන්ති යටතේ 70% ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය සඳහා

b. 2005 අංක 38 දරණ සංචාරක පනතේ වගන්ති යටතේ 12% ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය සඳහා

c. 2005 අංක 38 දරණ සංචාරක පනතේ වගන්ති යටතේ 14% ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සඳහා

d. 2005 අංක 38 දරණ සංචාරක පනතේ වගන්ති යටතේ 04% ක මුදලක් ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය සඳහා

2017 වසර තුලදී සංචාරක සංවර්ධන අරමුදින් ලත් මුදල් හා ලබා දුන් මුදල් පිළිබඳ විස්තර මෙම වාර්තාවේ අන්තර්ගත වේ.

සංචාරක සංවර්ධන අරමුදල

2017 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන අංක	2017 රු.	2016 රු.
ජංගම වත්කම්			
මුදල් හා මුදල් තුල්‍යයන්		373,591,199.92	639,762,905.00
ලැබිය යුතු දෑ	8	929,169,127.34	786,910,702.00
මුළු වත්කම්		**1,302,760,327.26**	**1,426,673,607.00**
ජංගම වගකීම්			
ගෙවිය යුතු දෑ	9	5,385,778.10	4,409,944.00
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය		181,632,436.90	199,116,913.00
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය		908,162,184.42	995,584,564.00
ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය		155,684,945.87	170,671,640.00
ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය		51,894,981.97	56,890,546.00
මුළු වගකීම්		**1,302,760,327.26**	**1,426,673,607.00**

පිටු අංක 11 සිට 13 දක්වා අඩංගු ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශනවල අත්‍යාවශ්‍ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත්කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීමට බැඳේ. මෙම මූල්‍ය ප්‍රකාශන අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදි.

ජී.ජී.එස්.එස්. කුමාර
අධ්‍යක්ෂ / මූල්‍ය කළමනාකරණ
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

පී.යූ. රත්නායක
අධ්‍යක්ෂ /ජනරාල්
ශ්‍රීලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

කාවන් රත්නායක
සභාපති
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

සංචාරක සංවර්ධන අරමුදල

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

මුල්‍ය කාර්ය සාධනය පිළිබඳ ප්‍රකාශනය

	සටහන අංක	2017 රු.	2016 රු.
ආදායම			
බදු	3	3,920,297,545.25	3,632,251,132.00
අනෙකුත් ආදායම්	4	12,342,049.05	11,899,181.00
මුළු ආදායම		**3,932,639,594.30**	**3,644,150,313.00**
වියදම්			
අරමුදල් පරිපාලන වියදම්	5	7,963,924.09	6,699,806.00
මුල්‍ය වියදම්	6	31,065.00	35,055.00
අරමුදල් බෙදාහැරීම්	7	3,924,644,605.21	3,637,415,452.00
මුළු වියදම්		**3,932,639,594.30**	**3,644,150,313.00**
කාල පරිච්ජේදය සඳහා අතිරික්තය / ඌනතාවය		**-**	**-**

හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනත හා 2003 අංක 28 දරණ මුදල් පනතට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ කළමනාකරණය හා පරිපාලනය සඳහා සංචාරක සංවර්ධන අරමුදල ක්‍රියාත්මක කර ඇත. එබැවින් සංචාරක සංවර්ධන අරමුදල සඳහා හිමිකම් වෙනස්විමේ ප්‍රකාශනයක් සකස් කරනු නොලැබේ. අරමුදලේ සිදුවෙන ගනුදෙනු වල ප්‍රතිඵලයක් ලෙස අරමුදල විසින් ලාභහෝ ආලාභ උපයනු නොලැබේ. මුළු ශුද්ධ ආදායම 2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනත මගින් නිශ්චිතව දක්වා ඇති පරිදි ආයතන හතර අතර බෙදාදී ඇත.

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	14%
ශ්‍රී ලංකාසංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	70%
ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය	12%
ශ්‍රී ලංකා සම්මුති කාර්යංශය	4%

සංචාරක සංවර්ධන අරමුදල
2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන අංක	2017 රු.	2018 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
ලැබීම්			
බදු		3,790,893,902.94	3,528,416,178.00
අනෙකුත් ලැබීම්		4,038,057.64	14,399,160.00
ගෙවීම්			
ණයහිමියන්ට ගෙවීම්		(4,056,960,725.81)	(3,317,615,388.00)
අනෙකුත් ගෙවීම්		(4,142,940.19)	(14,573,176.00)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**(266,171,704.80)**	**210,626,774.00**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
දේපල පිරියත උපකරණ මිලදී ගැනීමෙන් ලද මුදල් ප්‍රවාහ		-	-
දේපල පිරියත උපකරණ විකිණීමෙන් ලද මුදල් ප්‍රවාහ		-	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**-**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහ			
ලද ණයමුදල්		-	-
ආපසු ගෙවූ ණය මුදල්		-	-
රජය බෙදා හරින ලද ලාභාංශ		-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහ		**-**	**-**
මුදල් හා මුදල් තුල්‍යයන්හි ශුද්ධ වැඩිවීම / (අඩුවීම)		**(266,171,704.80)**	**210,626,774.00**
මුදල් හා මුදල් තුල්‍යයන්හි ආරම්භක ශේෂය		**639,762,904.72**	**429,136,131.00**
මුදල් හා මුදල් තුල්‍යයන්හි අවසාන ශේෂය		**373,591,199.92**	**639,762,905.00**

ගිණුම් සඳහා සටහන්

1. සංචාරක සංවර්ධන අරමුදල

2005 අංක 38 දරණ සංචාරක කටයුතු පනතේ 23 (ස) වගන්තිය යටතේ "සංචාරක සංවර්ධන අරමුදල" ස්ථාපිත කර ඇත. මෙම අරමුදලේ මුදල් සංචාරක සංවර්ධනය සහ ප්‍රවර්ධනය සඳහා යොදවනු ලැබේ. සංචාරක සංවර්ධන බදු එකතුකිරීම හා බෙදාහැරීම 2003 අංක 28 දරණ මුදල් පනත සහ 2005 අංක 38 දරණ සංචාරක පනත අනුව සිදු කරනු ලැබේ.

2. ගිණුම්කරණ අවශ්‍යතා

අරමුදලේ ගිණුම් සකස් කිරීම ශ්‍රී ලංකා රාජ්‍ය ව්‍යවසාය ගිණුම් ප්‍රමිත අනුව පිළියෙල කර ඇත.

3. බදු අරමුදල්

	2017 රු.	2016 රු.
අපගමන බදු	2,378,828,212.64	2,355,441,275.00
සංචාරක සංවර්ධන බදු	1,541,469,332.61	1,276,809,857.00
එකතුව	**3,920,297,545.25**	**3,632,251,132.00**

3.1 අපගමනබදු

සංචාරක පනතේ 23 (2) (අ) වගන්තිය යටතේ සමස්ත අපගමන බදු ආදායමෙන් භාණ්ඩාගාරයට ප්‍රෙෂණය කර ඉතිරියෙන් ඇ.ඩො. 5ක මුදල් ප්‍රමාණයක් සිවිල් ගුවන්සේවා අධිකාරිය විසින් ශ්‍රීලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ගෙවනු ලැබේ.

අපගමන බදු	2017 රු.	2016 රු.
2017 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා අපගමන බදු ලැබීම්	2,001,093,146.48	1,954,747,787.00
2017 ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු අපගමන බදු	377,735,066.16	400,693,488.00
මුළු අපගමන බදු	**2,378,828,212.64**	**2,355,441,275.00**

සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් ලබාදෙන ලද කෙටුම්පත් ඇස්තමේන්තුවෙන් 2017 නොවැම්බර් මස සිට දෙසැම්බර් මස දක්වා අපගමන බදු ප්‍රතිපාදන වශයෙන් රු. 377,735,066.16 දක්වා ඇත.

3.2 සංචාරක සංවර්ධන බදු

2003 අංක 28 දරණ මුදල් පනතට අනුව සංචාරක ක්ෂේත්‍රයට අයත් සෑම ආයතනයක්ම සංචාරක සංවර්ධන බදු ගෙවිය යුතුය. සංචාරක සංවර්ධන අධිකාරිය විසින් සංචාරක බදු මුදල් එකතු කිරීම හා සංචාරක සංවර්ධන අරමුදලට බැරකිරීම කරනු ලැබේ. 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා අදාල කාල පරිච්ඡේදය තුළ රුපියල් මිලියන 992 ක මුදලක් බදු වශයෙන් එකතු වී ඇත. තවද 2017 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා අපගමන බදු වශයෙන් මිලියන 549 ක මුදලක් ඇස්තමේන්තුගත ආදායම ලෙස ගිණුම්ගත කොට ඇත. තවද, මෙම වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා දීර්ඝ කාලයක් තිස්සේ ලැබුණු සත්‍ය සංචාරක සංවර්ධන බදු ලැබීම්වල ප්‍රතිශතයක් ලෙස මෙම මුදල ඇස්තමේන්තුකර ඇත.

සංචාරක සංවර්ධන බදු	2017 රු.	2016 රු.
2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ලැබීම්	992,141,806.70	891,326,356.00
2017 ඔක්තෝම්බර් සිට දෙසැම්බර් දක්වා ලැබිය යුතු	549,656,830.58	386,010,865.00

සංචාරක සංවර්ධන බදු ආපසු ගෙවීම්	(329,304.67)	(527,364.00)
2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා මුළු සංචාරක සංවර්ධන බදු ආදායම	**1,541,469,332.61**	**1,276,809,857.00**

4. අනෙකුත් ආදායම්

වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කොට ඇති වටිනාකම තුල මූලිකව අන්තර්ගත වන්නේ මුදල් පනත ප්‍රකාරව නියමිත දිනට ගෙවීම් සිදු නොකල ලියාපදිංචි ආයතනයන්හි ප්‍රමාද ගෙවීම් මත අයකල පොලී ආදායම වේ.

	2017 රු.	**2016 රු.**
වර්ෂය සඳහා බදු පමාකිරීමේ පොලී ආදායම	12,340,283.24	11,895,201.00
2012 සහ 2013 සඳහා විගණන ගාස්තුවට අදාල යෙදවුම් බද්ද (VAT)	-	3,585.00
අතිරික්ත තැපැල් හා බැංකු ගාස්තු	-	395.00
වෙනත් ආදායම්	1,765.81	-
එකතුව	**12,342,049.05**	**11,899,181.00**

5. අරමුදල් පරිපාලන පිරිවැය

	2017 රු.	**2016 රු.**
මුද්දර ගාස්තු	73,000.00	55,575.00
පරිපාලන වියදම්	7,765,924.09	6,442,081.00
විගණන ගාස්තු	125,000.00	202,150.00
එකතුව	**7,963,924.09**	**6,699,806.00**

6. මූල්‍ය පිරිවැය

	2017 රු.	**2016 රු.**
බැංකු ගාස්තු	31,065.00	35,055.00
එකතුව	**31,065.00**	**35,055.00**

7. අරමුදල් බෙදාහැරීම්

2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 24 (8) වගන්තිය අනුව අරමුදල බෙදාහැරීම පහත දැක්වෙන පරිදි වසරතුල සිදුවිය.

	2017 රු.	**2016 රු.**
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය	550,200,713.37	509,238,163.00
ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය	2,746,500,754.93	2,546,190,816.00
ශ්‍රී ලංකා සංචාරක හෝටල් කළමනාකරණ ආයතනය	470,957,352.59	436,489,854.00
ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය	156,985,784.32	145,496,618.00
එකතුව	**3,924,644,605.21**	**3,637,415,451.00**

8. ලැබිය යුතු දෑ

	2017 රු.	2016 රු.
ලැබිය යුතු අපගමන බදු	377,735,066.16	400,693,488.00
ලැබිය යුතු සංචාරක සංවර්ධන බදු	549,656,830.58	386,010,865.00
වෙනත් ණයගැතියන්	1,777,230.60	194,428.00
2012 සහ 2013 සඳහා විගණන ගාස්තුවට අදාල යෙදවුම් බද්ද (VAT)	-	11,921.00
එකතුව	**929,169,127.34**	**786,910,702.00**

9. ගෙවිය යුතු දෑ

	2017 රු.	2016 රු.
සංචාරක සංවර්ධන අරමුදලේ ඇතුලත් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අදාල ජංගම ගිණුම	509,834.00	-
උපචිත වියදම් - පරිපාලන පිරිවැය	4,149,333.10	4,101,333.00
උපචිත වියදම් - විගණන ගාස්තු	353,920.00	213,245.00
උපචිත වියදම් - මුද්දර ගාස්තු	40,425.00	63,100.00
අනෙකුත් ජංගම වගකීම්	332,266.00	32,266.00
එකතුව	**5,385,778.10**	**4,409,944.00**

මගේ අංකය
எனது இல.
My No. } ටීඅයිපී/ඒ/ටීඩීඑෆ්/01/17/04

ඔබේ අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2018 අගෝස්තු 26 දින.

සභාපති,

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය.

සංචාරක සංවර්ධන අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

සංචාරක සංවර්ධන අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳව සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් හා හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගනන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සංවාරක සංවර්ධන අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 නීතිරීති,රෙගුලාසි සහ කළමණාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

	නීති රීති,රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 24(3) වගන්තිය	සංචාරක සංවර්ධන බද්ද කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම සඳහා රීති සකස් කර නොතිබුණි.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි අංක 169(2)	චෙක්පත් උපලබ්ධි වීමට පෙර ආයතනය සේවා සපයා තිබීම හේතුවෙන් චෙක්පත් 07 කට අදාළව රු.143,505 ක මුදලක් අයකර ගැනිමට නොහැකිව තිබුණි.

2.3 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පරිපාලන වියදම් ගෙවීම සඳහා 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ විධිවිධාන සලසා නොතිබියදී අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත සමාලෝචිත වර්ෂයේදී පරිපාලන වියදම් ලෙස රු.7,765,924 ක මුදලක් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් ජනනය වූ ආදායම රු.මිලියන 3,933 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම රු.මිලියන 3,644 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ආදායමෙහි රු. මිලියන 289 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයෙහි සංචාරක සංවර්ධන බදු ආදායම රු. මිලියන 265 කින් වැඩි වී තිබීම ඉහත වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

2003 අංක 25 දරන මුදල් පනතේ 2 වන වගන්තිය ප්‍රකාරව එකතු කරන අපගමන බදු මුදලින් 1/3 හා 2005 අංක 38 දරන සංචාරක කටයුතු පිළිබඳ පනත යටතේ ඇති සංචාරක සංවර්ධන බදු මුදල, අරමුදලේ ආදායම වන අතර එය සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධනය හෝ සංවර්ධනය උදෙසා දරන ලද වියදම් වෙනුවෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය, ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය වෙත පිළිවෙලින් සියයට 70 ත් 12 ත් 14 ත් සහ 4 ක් බැගින් ලබා දීමට පනතින් ප්‍රතිපාදන සලසා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළදී යථෝක්ත ආයතන වෙත පිළිවෙලින් රු.2,747,251,224 ක්, රු.470,957,352 ක් රු.549,450,245 ක් හා රු.156,985,784 ක් වශයෙන් එකතු වටිනාකම රු.3,924,644,605 ක් ලබා දී තිබුණි.

4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 අංක 25 දරන මුදල් පනතේ 2(ආ) වගන්තිය අනුව ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන නැවකින් ශ්‍රී ලංකාවෙන් පිටත්ව යන මගියෙකු සඳහා නිකුත් කරන සෑම ටිකට් පතකින්ම බදු අයකර ඉන් කොටසක් අධිකාරිය වෙත ප්‍රේෂණය කලයුතු වුවත් එලෙස නැව් මඟින් ගමන්කරන මගීන්ගෙන් බදු අයකර අධිකාරිය වෙත එවා නොතිබුණි. 2017 වර්ෂය තුළදී ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව මගීන් 27565 ක් පිටත්ව ගොස් ඇති බැවින් ඒ වෙනුවෙන් එක මගියෙකුගෙන් ඇමරිකානු ඩොලර් 1.66 බැගින් සමාලෝචිත වර්ෂයට අදාලව අරමුදලට ලැබිය යුතු රු. 6,406,106 ක අපගමන බදු ආදායම අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු වලට අනුව 2017 වර්ෂයේදී ශ්‍රී ලංකාවෙන් ගුවන් මගින් පිටව ගොස් ඇති වයස අවුරුදු 02 ට වැඩි ශ්‍රී ලාංකිකයන් හා විදේශිකයන් සංඛ්‍යාව 3,653,370 ක් වූ බැවින් අරමුදලට ගුවන් මගින් පිටත්ව ගිය මගීන් වෙනුවෙන් රු 2,557,359,000 අපගමන බදු ආදායමක් ලැබිය යුතු වුවත් 2017 වර්ෂයේ

මූල්‍ය ප්‍රකාශන අනුව සංචාරක සංවර්ධන අරමුදලේ අපගමන බදු ලෙස වාර්තා වී තිබුනේ රු.2,378,828,212 කි. ඒ අනුව රු.178,530,788 ක වෙනසක් නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අරමුදලේ අධ්‍යක්ෂක ජනරාල්වරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුය.

පද්ධති හා පාලන ක්ෂේත්‍ර	නිරීක්ෂණ
(අ) අපගමන බදු එකතු කිරීම.	(i) නැව් මඟින් ගමන් කරන මගීන්ගෙන් බදු අය නොකිරීම (ii) ගුවන් මගින් ගමන් කරන මගීන්ගෙන් අයකරන බදු, ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව නොසැසඳීම.
(ආ) සංචාරක සංවර්ධන බදු එකතු කිරීම	පාරිභෝගිකයන්ගෙන් අයකර තිබූ බදු ප්‍රමාණය හා අරමුදලට අය වී තිබූ බදු මුදල් අතර වෙනස්කම් පැවතීම.

එච්.එම්.ගාමිණී විජේසිංහ
විගණකාධිපති

ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
අංක. 80, ගාලු පාර, කොළඹ 03, ශ්‍රී ලංකාව.
www.sltda.gov.lk